**ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව මුල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.2 නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් 04 ක වටිනාකම් වලට නැවත ගැලපීම් කිරීම නිසා ස්ථාවර වත්කම් සහ සමුච්චිත අරමුදල රු.39,278,521 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් නැවත ගැලපීම සිදුනොකළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 07 කට අදාළව බිල්කල ආදායම රු.7,450,140 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එය රු.6,170,962 ක් ලෙස රු1,279,178 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ආදායම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් සඳහා ලබාදුන් රු.64,142 ක වට්ටම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | වරිපනම් සඳහා ලබාදෙන වට්ටම් වියදම් ලෙස දැක්විය යුතුවේ. |
| (ඈ) | වරිපනම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ වරිපනම් හිඟය රු.861,837 ක් වුවත් අදාළ ලෙජර් ගිණුමේ එය රු.1,054,261 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හිඟහිටි වරිපනම් රු.192,424 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වරිපනම් හිඟ වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කඩකුලී ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ කඩකුලී බිල්කළ ආදායම රු.915,620 ක් වුවත් අදාළ ලෙජර් ගිණුමේ එය රු.906,620 ලෙස අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ කඩකුලී ආදායම හා ලැබිය යුතු කඩකුලී ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි කඩකුලී වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.188,750 ක් හා ලැබිය යුතු ව්‍යාපාර බදු රු.57,600 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පිළිගනිමි. | ලැබිය යුතු සියළු ආදායම් ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | පූර්ව වර්ෂවල ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 17 ක් වෙනුවෙන් කර්මාන්ත ණයහිමියන්ට ගෙවිය යුතුව තිබුණු රු.12,834,782 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු නමුත් අදාළ ලෙජර් ගිණුම්වලට හරකර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතුව තිබූ කර්මාන්ත ණයහිමි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ණයහිමි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඌ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) මගින් ක්‍රියාත්මක කළ ගලෙන්බිඳුණුවැව කෘෂිකර්ම කාර්යාලය පිටුපස මාර්ගය කාපට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු හා ලැබිය යුතු වටිනාකම් රු.2,800,868 ක් කර්මාන්ත ණයගැති සහ කර්මාන්ත ණයහිමි ගිණුම් තුළ ගිණුම්ගත කර නොතිබීම නිසා කර්මාන්ත ණයගැති සහ ණයහිමි ශේෂ වටිනාකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ණයගැති හා ණයහිමි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (එ) | පූර්ව වර්ෂවල ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 19 ක් වෙනුවෙන් කර්මාන්ත ණයගැතියන්ගෙන් ලැබිය යුතුව තිබුණු රු.11,620,713 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු නමුත් එය ලෙජර් ගිණුම්වලට බැරකර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ කර්මාන්ත ණයගැති වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ණයගැති වටිනාකම පමණක් ගිණුම්ගත කළයුතු වේ. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයගැති සහ ණයහිමි අතරුදවුම් මුදල් නිදහස් කිරීම් පිළිවෙලින් රු.2,880,011 ක් හා රු.3,174,834 ක් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතරුදවුම්, ණයගැති හා ණයහිමි ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි අතරුදවුම් වටිනාකම් පමණක් ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | 2019 වර්ෂයේදී වාහන 05 ක් කුලියට දීම් වෙනුවෙන් ලැබිය යුතු රු.364,700 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාහන කුලී ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | ලැබිය යුතු සියළු ආදායම් ගිණුම්ගත කළයුතු වේ. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ නිමකර ඇති බවට සහතික කර තිබුණු රු.2,173,905 ක බෝක්කු හා පාලම් ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් ප්‍රාග්ධන වියදම් ලෙස දැක්වීම වෙනුවට මාර්ග අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිගනිමි. | සියළු ප්‍රාග්ධන වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.1,849,758,530 ක් වූ වත්කම්, වගකීම් සහ ආදායම් වියදම් ගිණුම් 231 ක් සඳහා ලෙජර් ගිණුම් සහ ජ'නල් සටහන් පිළියෙල කර නොතිබුණි. | පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර ලෙජර් ගිණුම් සහ ජ'නල් සටහන් පිළියෙල කර තිබිය යුතුවේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයා විසින් 2020 ජූලි 03 දින නිකුත් කරන ලද අංක 2182/39 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ III වන පරිච්ඡේදයේ රීති අංක 64 | 2020 ජුනි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළ වටිනාකම රු. 27,905,973 ක් වූ ගෙවීම් වවුචර් 895 ක් අනුමත කිරීම හා සහතික කිරීම සභාපතිවරයා විසින්ම සිදුකර තිබුණි. | පිළිගනිමි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ආ) | උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2020 මාර්තු 28 දිනැති අංක NCP/LG/DE/04/04/2020 දරන ලිපිය | ප්‍රාදේශීය සභාවේ යන්ත්‍රෝපකරණ කොන්ත්‍රාත් බිල්පතින් අඩුකර ගැනීමේ පදනම මත අවස්ථා 333 කදී රු.3,533,000 කට බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබාදී තිබුණි. | පිළිගනිමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.53,653,628 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,063,934 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2020 දෙසැම්බර් 31 දිනට රු.4,826,135 ක් වූ වරිපනම් හිඟය අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර එම වටිනාකම අනුරූපී වාර්තා සමඟ රු.873,182 කින් වෙනස් විය. | පිළිගනිමි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,777,000 ක් වූ හිඟහිටි කුලී අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණු අතර එම වටිනාකම අනුරූපී වාර්තා සමඟ රු.111,500 කින් වෙනස් විය. | පිළිගනිමි. | හිඟ කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| **(ඇ) බලපත්‍ර ගාස්තු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,314,787 ක් වූ බලපත්‍ර හා සේවා ගාස්තු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. | අදාළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොකුණු ව්‍යාපෘතියට අදාළව නඩු තීන්දුව ප්‍රකාරව සභාවේ දේපල වෙන්දේසි කර මුදල් ගෙවා තිබුණු අතර තවත් රු.4,245,707 ක් ගෙවිය යුතුව පැවති අතර 2012 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 08 ක් ගතවීත් ගෙවිය යුතු ඉතිරි මුදල් සම්බන්ධව කළමනාකාරිත්වය අදාළ පාර්ශවයන් සමඟ විධිමත් නෛතික එකඟතාවයකට පැමිණ නොතිබුණි. | නීති උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කරමි. | මෙම මුදල් ගෙවිය යුතු දැයි යන්න නිශ්චිතව තහවුරු කරගත යුතුවේ. |